ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී (ගෞරව) උපාධි වැඩසටහන 2022/2023

4 වන මට්ටම

අවසාන පරීක්ෂණය

**EPU4534 - මුල් ළමාවිය සහ ප්‍රාථමික පාසල් අවධියේ සමායෝගීවීමේ ගැටලු.**

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2024.03.10 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. "සමායෝගී ගැටලු" යන්න ඔබගේ වචනයෙන් නිර්වචනයක් ලියන්න.

02. සමායෝගී ගැටලු සහිත ළමුන් අතර දක්නට ලැබෙන පොදු රෝග ලක්ෂණ හතරක් **(04)** නම් කර ඒවායින් දෙකක් (02) උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

03. මුල් ළමාවියේ ළමයින්ගේ දැකිය හැකි සමායෝගී ගැටලු වර්ග තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

04. සමායෝගී ගැටලු සහිත ළමයින්ගේ ස්වභාවයන් තුනක් **(03)** දක්වා ඒවා පැහැදිලි කරන්න.

05. සමායෝගී ගැටලු සහිත ළමයෙකු සිටින පවුලක, පවුලේ සාමාජිකයෙකුගේ කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

06. **"විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය"** යන්න නිර්වචනය කරන්න.

07. (a) ළමුන් තුළ සමායෝගී ගැටලු ඇති කළ හැකි ආතති සහගත අවස්ථා ආකාර පහක් **(05)** නම් කරන්න.

    (b) එම අවස්ථා ඔවුන්ගේ ජීවිතයට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

08. සමායෝගී ගැටලු හේතුවෙන් අන්තර්කරණ පන්ති කාමරයක සිටින චිත්තවේගී තත්ත්වයන් පෙන්නුම් කරන විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ගේ කාණ්ඩ පහක් **(05)** ලැයිස්තුගත කරන්න.

(ලකුණු 5 X 8 = 40)

## 02 - කොටස

09. (i.) (a) සමායෝගී ගැටලු සහිත ළමයින්ට ධනාත්මකව බලපාන පරිසර සාධක පහක් **(05)** නම් කරන්න. (ලකුණු - 05)

(b) ඒවායින් තුනක් **(03)** උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 05)

(ii.) සමායෝගී ගැටලු සහිත ළමයින් කෙරෙහි පාසල බලපාන ආකාර හතරක් **(04)** විවේචනාත්මකව විමර්ශනය කරන්න. (ලකුණු - 10)

10. "බොහෝ විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට නිවසින් පාසලට සංක්‍රමණය වීම තීරණාත්මක අදියරක් වේ."

(i.) "නිවසින් පාසලට සංක්‍රමනය වීම" යන්න විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට අදාලව පැහැදිලි කරන්න. (ලකුණු - 08)

(ii.) විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට පහසුකම් සපයන ගුරුවරයෙකු වශයෙන් විශේෂ අවශ්‍යතා සහිත ළමුන් මුහුණ දෙන පාරිසරික ගැටලු සම්බන්ධයෙන් ඔබ හඳුනාගත් අභියෝග තුනක් **(03)** නම් කරන්න. (ලකුණු - 05)

(iii.) එම අභියෝග මඟහරවා ගැනීම සඳහා යෝජනා තුනක් **(03)** ඉදිරිපත් කරන්න. (ලකුණු - 07)

11. (i.) ඇල්බට් බැන්ඩුරා විසින් හඳුනා ගන්නා ලද නිරීක්ෂණාත්මක ඉගෙනුම් ආකෘති තුනක් **(03)** නම් කර ඒවා උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) සමායෝගී ගැටලු සහිත ළමුන් සඳහා උපකාරි වන ගුරු නිපුණතා පහක් **(5)** පැහැදිලි කරන්න. (ලකුණු - 10)

12. (i.) එරික් එරික්සන් (1958) දක්වන ලද මනෝ සමාජීය සංවර්ධනයේ උපතේ සිට අවුරුදු 11 දක්වා අවධීන් සඳහන් කරන්න. (ලකුණු - 04)

(ii.) එරික් එරික්සන්ගේ මනෝ සමාජීය සංවර්ධන අවධි විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට, සාමාන්‍ය ළමුන්ට වඩා වෙනස් වන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු - 08)

(iii.) ගුරුවරුන් සහ රැකබලාගන්නන් මෙම ළමුන්ට උපකාර කළ හැකි ආකාරය පිළිබඳ උදාහරණ සපයන්න. (ලකුණු - 08)

13. (i.) සමායෝගී ගැටලු සහිත ළමයින්ගේ සමාජ සංවර්ධනය සඳහා ගුරුවරුන්, දෙමව්පියන් සහ රැක බලාගන්නන් දායක වියහැකි ආකාරය සුදුසු උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු - 10)

(ii.) සමායෝගී ගැටලු සහිත ළමුන්ට පහසුකම් සැලසීමේදී සමවයස්කයන්, දෙමව්පියන්, සහ ප්‍රජාව විසින් සපයනු ලබන උපකාරයේ වැදගත්කම් තුනක් **(03)** සාකච්ඡා කරන්න. (ලකුණු - 10)

- සියලුම හිමිකම් ඇවිරිණි. -